# දම්සක් පැවතුම් සූත්‍රය

සංස්කරණය :- ජී.එල්.සතරසිංහ

ධර්ම දානය පිණිස පමණි.

ධර්ම දානය සඳහා මුද්‍රණ විමසීම්.

මුද්‍රණය

දිමුතු මුද්‍රණාලය

අංක 103/A, නුවර පාර, යක්කල.
දුරː 033-2239662 / 077-8829705
විද්‍යුත් තැපෑලː dimuthupub@yahoo.com
දහම් පොත් කියවීම සඳහා පිවිසෙන්න.
වෙබ්ː www.dhammadanabooks.com

# සම්පාදක සටහන

අප තිලෝගුරු අමාමෑණී සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ අති උතුම් මංගල ධර්ම දේශනාව බැවින් ද, සිංහල පරිවර්තනයෙන් පිරිපුන් බැවින් ද, මෙම දම්සක් පැවතුම් සූත්‍ර දේශනාව ඉතා ගෞරව පෙරදැරිව සජ්ජායනා කරණ මෙන් හද බැතියෙන් ඉල්ලා සිටිමි.

ඉතා කුඩා අකුරින් මුද්‍රණය වී තිබූ එම මුල් පිටපත, කියවීමේ පහසුව පිණිස ලොකු අකුරින් මුද්‍රණය කොට එළි දැක්වීමට අදහස් කළෙමි. මා විසින් මෙම ධර්ම දානය සිදු කිරීමට සූදානම් වූ අවස්ථාවේ මාගේ ඥාතීන් හා උපාසිකා මාතාවන් කිහිප දෙනෙක් ද දායකත්වය ලබා දුන්හ.

කුසුම් සේනානායක, කුමාරි බියන්විල, පද්මා සෙනෙවිරත්න, පසුලා නවමලී සෙනෙවිරත්න, ස්වර්ණා සේනානායක යන මහත්මීන් එසේ දායකත්වය දැක්වූ අය අතර වේ. ඒ සියළු දෙනාගේම මියගිය ඥාතීන්ට මෙම කුසලය අනුමෝදන් කරමු. අනුමෝදන් වෙත්වා.!!!

කලට වේලාවට මෙම ග්‍රන්ථය මනා ලෙස මුද්‍රණය කිරීමට සහාය දුන් යක්කල, දිමුතු මුද්‍රණාලය අධිපති තුමන් ඇතුළු කාර්යමණ්ඩලයටත්, අප සැමටත් උතුම් නිවන් අවබෝධය පිණිසම මෙම පින හේතු වාසනා වේවා.!


මෙයට,
සසුන් ලැදි,
ලයනා සතරසිංහ
උපාසිකා මාතාව.

"සඳගිර"
391, දොරණගොඩ
බෙම්මුල්ල.


2017 ඇසළ පුන්පොහෝ දින.



# දම්සක් පැවතුම් සූත්‍රය

**නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස///**

**එවං මේ සුතං, ඒකං සමයං භගවා බාරාණසියං විහරති ඉසිපතනේ මිගදායේ, තත්‍ර ඛෝ භගවා පඤ්චවග්ගියේ භික්ඛු ආමන්තේසි.**

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බරණැස ඉසිපතන නම් වූ මිගදායේ වැඩ වසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ පස්වග මහනුන් ඇමතු සේක.

**ද්වේ මේ භික්ඛවේ, අන්තා පබ්බජිතේන න සේවිතබ්බා.**

පින්වත් මහණෙනි, පැවිද්දන් විසින් සේවනය නොකළ යුතු වූ මේ අන්ත දෙකකි.

**යෝචායං කාමේසු කාමසුඛල්ලිකානුයෝගෝ හීනෝ ගම්මෝ පෝථුජ්ජනිකෝ අනරියෝ අනත්ථසංහිතෝ.**

යම් මේ කාමයන්හි කාම සුඛයේ ඇලී ගැලී වාසය කිරීමක් ඇද්ද, මෙය හීන වූ දෙයකි. ලාමක වූ දෙයකි. පුහුදුන් ජනයා විසින් සේවනය කරන දෙයකි. උත්තම මිනිසුන් විසින් සේවනය නොකරන දෙයකි. අනර්ථ සහිත දෙයකි.

**යෝචා යං අත්තකිලමථානුයෝගෝ දුක්ඛෝ අනරියෝ අනත්ථසංහිතෝ.**

පින්වත් මහණෙනි, යම් ඒ තමාව පීඩාවට පත් කරවන වැඩ පිළිවෙලක් ඇත්ද එය දුක් සහිත දෙයකි. අනර්ථ සහිත දෙයකි.

**ඒ තේ භික්ඛවේ උභෝ අන්තේ අනුපගම්ම මජ්ඣිමා පටිපදා. තථාගතේන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති.**

පින්වත් මහණෙනි, ඒ මේ අන්ත දෙකට නොපැමිණ තථාගතයන් වහන්සේ විසින් මධ්‍යම ප්‍රතිපදාව අවබෝධ කරන ලදී. මේ මධ්‍යම ප්‍රතිපදාව දහම් ඇස ලබා

දෙයි. නුවණ උදාකරයි. සංසිඳීම ඇතිකරයි. විශේෂ ඥානය ඇති කරයි. නිවන පිණිස පවතින්නේ ය.

**කතමා ච සා භික්ඛවේ, මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති?**

පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද දහම් ඇස ලබාදෙන, නුවණ උදාකරන, සංසිඳීම ඇති කරන විශේෂ ඥාණය ඇති කරන, අවබෝධය ඇතිකරන, නිවන පිණිස පවතින්නා වූ මධ්‍යම ප්‍රතිපදාව නම් කුමක්ද?

**අයමේව අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ, සෙය්‍යථීදං සම්මා දිට්ඨි, සම්මාසංකප්පෝ, සම්මාවාචා, සම්මාකම්මන්තෝ, සම්මා ආජීවෝ, සම්මාවායාමෝ, සම්මාසති, සම්මාසමාධි.**

ඒ මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. එනම් සම්මා දිට්ඨිය ද, සම්මා සංකප්පය ද සම්මා වාචා සම්මා කම්මන්තය ද සම්මා ආජීවය ද සම්මා වායාමය ද සම්මා සතිය ද සම්මා සමාධිය ද යන මෙයයි.

**අයං ඛෝ සා භික්ඛවේ, මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති.**

පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද දහම් ඇස ලබාදෙන, නුවණ උදාකරණ, සංසිඳීම ඇතිකරන, අවබෝධය ඇතිකරන, නිවන පිණිස පවතින්නා වූ ඒ මධ්‍යම ප්‍රතිපදාව නම් මෙයයි.

**ඉදං ඛෝ පන භික්ඛවේ දුක්ඛං අරියසච්චං ජාති පි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛෝ මරණම්'පි දුක්ඛං අප්පියේහි සම්පයෝගෝ දුක්ඛෝ පියේහි විප්පයෝගෝ දුක්ඛෝ යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං සංඛිත්තේන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා.**

පින්වත් මහණෙනි, මෙය වනාහි දුක නම් වු ආර්ය සත්‍යයයි. ඉපදීම ද දුකකි. ජාරාවට පත්වීම දුකකි. රෝග පීඩා වැළඳීම ද දුකකි. මරණය ද දුකකි. අප්‍රිය පුද්ගලයන් හා අප්‍රිය වස්තුන් සමඟ එක්වීමද දුකකි. කැමති වන්නා වූ යම් දෙයක් ඇත් ද එය නොලැබීම ද දුකකි. සංක්ෂේපයෙන් කීවොත් පංච උපදානක්ඛන්ධයෝම දුකකි.

**ඉදං ඛෝ  පන භික්ඛවේ දුක්ඛසමුදයං අරියසච්චං යායං තණ්හා පොනෝභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී, සෙය්‍යථිදං: කාමතණ්හා භවතණ්හා විභවතන්හා.**

පින්වත් මහණෙනි, මෙය වනාහි දුක් ඇතිවීම නම් වූ ආර්ය සත්‍යයයි. පුණර්භවය ඇතිකරන ආශ්වාදයෙන් ඇලෙන්නා වූ ඒ ඒ තැන සතුටින් පිළිගන්නා වූ යම් ඒ තණ්හාවක් ඇත් ද එයයි. එනම් කාම තණ්හාව ය. භව තණ්හාව ය. විභව තණ්හාව ය.

**ඉදං ඛෝ පන භික්ඛවේ, දුක්ඛනිරෝධං අරියසච්චං. යෝ තස්සායේව තණ්හාය ආසේසවිරාගනිරෝධෝ චාගෝ පටිනිස්සග්ගෝ මුත්ති අනාලයෝ.**

පින්වත් මහණෙනි, මෙය වනාහි දුක නැතිවීම නම් වූ ආර්ය සත්‍යයයි. ඒ තණ්හාවේම ඉතිරි නැතිව නො ඇල්මෙන් නිරුද්ධ වීමක් වේද දුරු වීමක් වේද තණ්හාවෙන් මිදීමක් වේද ඉතිරි නොකොට හැරීමක්වේද ආලය නැතිවීමක් වේද එයයි.

**ඉදං ඛෝ පන භික්ඛවේ, දුක්ඛනිරෝධ ගාමිනීපටිපදා අරියසච්චං, අයමේව අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ, සෙය්‍යථිදංඃ, සම්මා දිට්ඨි සම්මා සංකප්පෝ, සම්මා වාචා සම්මාකම්මන්තෝ සම්මා ආජීවෝ සම්මා වායාමෝ සම්මාසති සම්මාසමාධි.**

පින්වත් මහණෙනි, මෙය වනාහි දුක් නැතිවීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යයයි. මහණෙනි මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයම දුක්ඛ නිරෝධ ගාමිණි පටිපදාර්ය සත්‍යය වේ. එනම් සම්මා දිට්ඨිය ද සම්මා සංකප්පයද, සම්මා වාචා, සම්මා කම්මන්තය ද සම්මා ආජීව සම්මා වායාම සම්මා සති සම්මා සමාධිය ද යන මෙයයි.

**ඉදං දුක්ඛං අරියසච්චන්තිමෙ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

පින්වත් මහණෙනි, මෙය වනාහි දුක නම් වු ආර්යය සත්‍යයයි කියා මා හට පෙර නො ඇසු විරූ ධර්මයන්හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤෙය්‍යන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

ඒ දුක නම්වූ ආර්‍ය සත්‍යය පරිපූර්ණ වශයෙන්ම අවබෝධ කළ යුතුයි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන්හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤාතන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

ඒ දුක නම් වූ ආර්‍ය සත්‍යය පරිපූර්ණ වශයෙන්ම අවබෝධ කරන ලදි යි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන්හි දහම් ඇස පහළ විය. ඤාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**ඉදං දුක්ඛසමුදයං අරියසච්චන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා**

උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

පින්වත් මහණෙනි, මෙය වනාහි දුක ඇතිවීම නම් වූ ආර්යය සත්‍යයයි. කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන්හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛසමුදයං අරියසච්චං පහාතබ්බන්ති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදී.**

ඒ දුක් ඇතිවීම නම් වූ ආර්ය සත්‍යය ප්‍රහාණය කළ යුතුයි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන්හි දහම් ඇස පහළ විය.ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛසමුදයං අරියසච්චං පහීණන්ති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

ඒ දුක් ඇතිවීම නම්වූ ආර්ය සත්‍ය ප්‍රහාණය කරන ලදැයි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන්හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**ඉදං දුක්ඛනිරෝධං අරියසච්චන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

පින්වත් මහණෙනි, මෙය වනාහි දුක නැතිවීම නම් වූ ආර්ය සත්‍යයි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන්හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛනිරෝධං අරියසච්චං සච්ඡිකාතබ්බන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

ඒ දුක් නැතිකිරීම නම් වූ ආර්ය

සත්‍යය (විද්‍යා විමුක්ති) වශයෙන් සාක්ෂාත් කළ යුතුයි කියා (කෘත්‍යඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන්හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥව පහළ විය. විද්‍යව පහළ විය. ආලෝකය පහළ විය.

**තං ඛෝ පනිදං දුක්ඛනිරෝධං අරියසච්චං සච්ඡිකාතන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

ඒ දුක් නැතිකිරීම නම් වූ ආර්ය සත්‍යය (විද්‍යා විමුක්ති) වශයෙන් සාක්ෂාත් කරනු ලබයි කියා (කෘතඥන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන්හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**ඉදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

පින්වත් මහණෙනි,මෙය වනාහි දුක් නැතිවීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්‍ය සත්‍යය යයි කියා (සත්‍ය ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන්හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය.ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං බෝ පනිදං දුක්ඛනිරෝධ ගාමිණීපටිපදා අරියසච්චං භාවේතබ්බන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

ඒ දුක් නැතිවීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්‍ය සත්‍යය (ශිල - සමාධි - ප්‍රඥා) ප්‍රගුණ කළ යුතු යැයි කියා (කෘත්‍ය ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන්හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය.ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**තං බෝ පනිදං දුක්ඛනිරෝධ ගාමිණීපටිපදා අරියසච්චං භාවිතන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

ඒ දුක් නැතිවීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යය (ශිල - සමාධි - පඥා තුළ) ප්‍රගුණ කරන ලදි' යි කියා (කෘත ඥාන) මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන්හි දහම් ඇස පහළ විය. ඥාණය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

**යාවකීවඤ්ච මේ භික්ඛවේ, ඉමේසු චතුසු අරියසච්චේසු ඒවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං න සුවිසුද්ධං අහෝසි. නේවතාවා'හං භික්ඛවේ, සදේවකේ ලෝකේ සමාරකේ සබ්‍රහ්මකේ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදේව මනුස්සාය අනුත්තරං සම්මාසම්බෝධිං අභිසම්බුද්ධෝ පච්චඤ්ඤාසිං.**

පින්වත් මහණෙනි, මේ චතුරාර්ය සත්‍යය ධර්මයන් පිළිබඳ මේ ආකාරයට පරිවර්ථ තුනකින් යුතුව ආකාර දොළසකින් යුතුව සැබෑ තත්ත්වය නම් වූ ඥාණ දර්ශනය සුවිශුද්ධ ලෙස මා හට යම්තාක් අවබෝධ නොවූයේ වේද,

ඒතාක් කල්ම පින්වත් මහණෙනි, දෙවියන් සහිත වූ ලෝකයෙහි, මරුන්

සහිත වූ, බඹුන් සහිත වූ, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ දෙව් මිනිස් ප්‍රජාව තුළ මේ වනාහි අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කෙළෙමි'යි ප්‍රතිඥා නොදුන්නෙමි.

**යතෝච බෝ මේ භික්ඛවේ ඉමේසු චතූසු අරියසච්චේසු ඒවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහෝසි. අථා'හං භික්ඛවේ, සදේවකේ ලෝකේ සමාරකේ සබ්‍රහ්මකේ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදේව මනුස්සාය අනුත්තරං සම්මාසම්බෝධිං අභිසම්බුද්ධෝ පච්චඤ්ඤාසිං.**

පින්වත් මහණෙනි, මා හට යම් කලක මේ චතුරාර්ය සත්‍ය ධර්මයන් පිළිබඳව මේ ආකාරයට පරිවර්ථ තුනකින් යුතුව සුවිශුද්ධ ලෙසටම අවබෝධ වූයේවේද?

ඒතාක් කල්ම පින්වත් මහණෙනි, දෙවියන් සහිත වූ ලෝකයෙහි, මරුන් සහිත වූ, බඹුන් සහිත වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ දෙව් මිනිස් ප්‍රජාව තුළ මම වනාහි අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කෙළෙමි' යි ප්‍රතිඥා දුන්නෙමි.

**ඤාණඤ්ච පන මේ දස්සනං උදපාදි අකුප්පා චේ තෝ විමුත්ති අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවෝ ති.**

මා හට ඥාන දර්ශනය පහළ විය. මාගේ චේතෝ විමුක්තිය වෙනස් නොවන්නේ ය. මෙය වනාහි අන්තිම ඉපදීම වේ. දැන් මා හට පුනර්භවයක් නැත්තේ ය.

**ඉදමවෝච භගවා, අත්තමනා පඤ්චවග්ගියා භික්ඛු භගවතෝ භාසිතං අභිනන්දුන්ති.**

භාග්‍යවතුන් වහන්සේ මේ ධම්මචක්ඛ දේශනය වදාළ සේක. අතිශයින්ම සතුටට පත්වූ ඒ පස්වග භික්ෂූන් වහන්සේලා සොම්නසින් යුතුව පිළිගත්තාහු ය.

**ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානේ ආයස්මතෝ කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්ම චක්ඛුං උදපාදි යංකිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරෝධධම්මන්ති.**

මේ ධම්මචක්ක දේශනාව වදාරණ කල්හි අයුෂ්මත් කොණ්ඩඤ්ඤයින් වහන්සේට හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා වූ යම් දෙයක් ඇත් ද හේතු නිරුද්ධ වීමෙන් සියල්ලම නිරුද්ධ වී යන

ස්වභාවයෙන් යුක්ත යැයි කියා කෙළෙස් රහිත වූ අවිද්‍යා මලකඩ රහිත වූ දහම් ඇස පහළ විය.

**පවත්තිතේච පන භගවතා ධම්මචක්කේ භුම්මා දේවා සද්දමනුස්සාවේසුං, ඒතං භගවතා බාරාණාසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.**

අපගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදි. එය වනාහි ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකු හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නොහැක්කේම ය'යි කියා පොළොව වාසී දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

**භුම්මානං දේවානං සද්දං සුත්වා චාතුම්මහාරාජිකා දේවා සද්දමනුස්සාවේසුං, ඒතං භගවතා බාරාණාසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං**

අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.

පොළොව වාසී දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා චාතුම්මහාරාජික දෙවියෝ දහම් ඝෝෂා පැවත්වූවාහුය.

චාතුර්මහාරාජිකානං දේවනං සද්දං සුත්වා තාවතිංසා දේවා සද්දමනුස්සාවේසුං, ඒතං භගවතා බාරාණාසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.

චාතුම්මහාරාජික දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා තාවතිංස දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

තාවතිංසානං දේවනං සද්දං සුත්වා යාමා දේවා සද්දමනුස්සාවේසුං, ඒතං භගවතා බාරාණාසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා

බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.

තාවතිංස දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා යාම දෙවියෝ දහම් ඝෝෂා පැවත්වූවහු ය.

**යාමානං දේවානං සද්දං සුත්වා තුසිතා දේවා සද්දමනුස්සාවේසුං, ඒතං භගවතා බාරාණාසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.**

යාම දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා තුසිත දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

**තුසිතානං දේවානං සද්දං සුත්වා නිම්මාණරතී දේවා සද්දමනුස්සාවේසුං, ඒතං භගවතා බාරාණාසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.**

තුසිත දෙවියන්ගේ දහම් ඝෝෂාව

අසා නිම්මානරතී දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

**නිම්මාණරතීනං දේවානං සද්දං සුත්වා පරනිම්මිතවසවත්ති දේවා සද්දමනුස්සාවේසුං ඒතං භගවතා බාරාණාසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.**

නිම්මානරතී දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා පරනිම්මතවසවත්ති දෙවියෝ දහම් ඝෝෂා පැවත්වූවාහු ය.

**පරනිම්මිතවසවත්තීනං දේවානං සද්දං සුත්වා බ්‍රහ්මපාරිසජ්ජා දේවා සද්දමනුස්සාවේසුං, ඒතං භගවතා බාරාණාසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.**

පරනිම්මිතවසවත්ති දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා බ්‍රහ්මපරිසජ්ජ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

**බ්‍රහ්මපාරිසජ්ජානං දේවානං සද්දං**

සුත්වා බ්‍රහ්මපුරෝහිතා දේවා
සද්දමනුස්සාවේසුං, ඒතං භගවතා
බාරාණසියං ඉසිපතනේ මිගදායේ
අනුත්තරං ධම්මචක්කං පවත්තිතං
අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන
වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා
කේනචි වා ලෝකස්මින්ති.

බ්‍රහ්මපාරිසජ්ජ දෙවියන්ගේ දහම්
ඝෝෂාව අසා බ්‍රහ්මපුරෝහිත දෙවියෝ
දහම් ඝෝෂා පැවත්වූවාහු ය.

බ්‍රහ්මපුරෝහිතානං දේවානං සද්දං
සුත්වා මහාබ්‍රහ්මා දේවා
සද්දමනුස්සාවේසුං, ඒතං භගවතා
බාරාණසියං ඉසිපතනේ මිගදායේ
අනුත්තරං ධම්මචක්කං පවත්තිතං
අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන
වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා
කේනචි වා ලෝකස්මින්ති.

බ්‍රහ්ම පුරෝහිත දෙවියන්ගේ දහම්
ඝෝෂාව අසා මහා බ්‍රහ්ම දෙවියෝ දහම්
ඝෝෂා පැවැත්වූවාහු ය.

මහාබ්‍රහ්මානං දේවනං සද්දං සුත්වා
පරිත්තාභා දේවා සද්දමනුස්සාවේසුං, ඒතං

භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.

මහා බ්‍රහ්ම දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා පරිත්තාභ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

පරිත්තාභාණං දේවානං සද්දං සුත්වා අප්පමණාභා දේවා සද්දමනුස්සාවේසුං, ඒතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.

පරිත්තාභ දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා අප්පමාණාභ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

අප්පමාණාභානං දේවනං සද්දං සුත්වා ආභස්සරා දේවා සද්දමනුස්සාවේසුං, ඒතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං

අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.

අප්පමාණාභ දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා ආභස්සර දෙවියෝ දහම් ඝෝෂා පැවත්වූවාහු ය.

ආභස්සරාණං දේවානං සද්දං සුත්වා පරිත්තසුභා දේවා සද්දමනුස්සාවේසුං, ඒතං භගවතා බාරාණාසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.

ආභස්සර දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා පරිත්තසුභ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

පරිත්තසුභානං දේවානං සද්දං සුත්වා අප්පමාණසුභා දේවා සද්දමනුස්සාවේසුං, ඒතං භගවතා බාරාණාසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.

පරිත්තසුභ දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා අප්පමාණසුභ දෙවියෝ දහම් ඝෝෂා පැවත්වූවාහු ය.

අප්පමාණසුභානං දේවානං සද්දං සුත්වා සුභකිණ්හකා දේවා සද්දමනුස්සාවේසුං, ඒතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.

අප්පමාණසුභ දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා සුභකිණ්හක දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

සුභකිණ්හකානං දේවානං සද්දං සුත්වා වේහප්ඵලා දේවා සද්දමනුස්සාවේසුං, ඒතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.

සුභකිණ්හක දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා වේහප්ඵලා දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

වේහප්ඵලානං දේවානං සද්දං සුත්වා අවිහා දේවා සද්දමනුස්සාවේසුං, ඒතං භගවතා බාරාණාසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.

වේහප්පල දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා අවිහ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

අවිහානං දේවනං සද්දං සුත්වා අතප්පා දේවා සද්දමනුස්සාවේසුං, ඒතං භගවතා බාරාණාසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.

අවිහ දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා අතප්පප දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

අතප්පානං දේවානං සද්දං සුත්වා සුදස්සා දේවා සද්දමනුස්සාවේසුං, ඒතං භගවතා බාරාණාසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.

අතප්ප දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා සුදස්ස දෙවියෝ දහම් ඝෝෂා පැවත්වූවාහු ය.

සුදස්සානං දේවානං සද්දං සුත්වා සුදස්සී දේවා සද්දමනුස්සාවේසුං, ඒතං භගවතා බාරාණාසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.

සුදස්ස දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා සුදස්සි දෙවියෝ දහම් ඝෝෂා පැවත්වූවාහු ය.

සුදස්සීනං දේවානං සද්දං සුත්වා අකණිට්ඨකා දේවා සද්දමනුස්සාවේසුං, ඒතං භගවතා බාරාණාසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං

**පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්ති.**

සුදස්සී දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා අපගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි  අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදී. එය වනාහි ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට ලෝකයෙහි වෙන කවරකුට හෝ වෙනස් කල නොහැක්කේ ම යයි කියා අකනිට්ඨ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහුය.

**ඉතිහ තේන ඛණේන තේන මුහුත්තේන යාව බ්‍රහ්මලෝකා සද්දෝ අබ්භුග්ගඤ්ඡි අයඤ්ච දසසහස්සී ලෝකාධාතු සංකපි සම්පකම්පි සම්පවේධි. අප්පමාණෝ ච උළාරෝ ඕභාසෝ ලෝකේ පාතුරහෝසි අතික්කම්ම දේවානං දේවානුභවන්ති.**

ඒ කෙණෙහිම, ඒ මොහොතෙහිම බ්‍රහ්ම ලෝක යම්තාක් වේද ඒ තාක් ම මේ දහම් ඝෝෂාව පැතිර ගියේ ය. මේ දස දහසක් ලෝක ධාතුව කම්පා විය. තදින්ම කම්පා විය. බලවත්ව වෙව්ලා කම්පා විය. දෙවියන්ගේ දේවානුභාවය ඉක්මවා ගිය

අප්‍රමාණ වූ ආලෝකයක් ලෝකයෙහි පැතිර ගියේ ය.

**අථ ඛො භගවා උදානං උදානේසි. අඤ්ඤාසි වත භෝ කෝණ්ඩඤ්ඤෝ අඤ්ඤාසි වත භෝ කොණ්ඩඤ්ඤෝති. ඉතිහිදං ආයස්මතෝ කොණ්ඩඤ්ඤස්ස අඤ්ඤාකොණ්ඩඤ්ඤෝත්වේව නාමං අහෝසි'ති.**

එකල්හි භාග්‍යවතුන් වහන්සේ උදානයක් පහළ කළ සේක.

භවත් කොණ්ඩඤ්ඤ තෙමේ ඒකාන්තයෙන්ම අවබෝධ කළා! භවත් කොණ්ඩඤ්ඤ තෙමේ ඒකාන්තයෙන්ම අවබෝධ කළා ! භවත් කොණ්ඩඤ්ඤ තෙමේ ඒකාන්තයෙන්ම අවබෝධ කළා !

මේ ආකාරයෙන් ආයුෂමත් කොණ්ඩඤ්ඤයන් වහන්සේට අඤ්ඤා කොණ්ඤ්ඤ යන නාමය ඇතිවූයේ ය.

**ඒතේන සච්ච වජ්ජේන සොත්ථී මේ හෝතු සබ්බදා**
**ඒතේන සච්ච වජ්ජේන සබ්බ රෝගෝ විනස්සතු**
**එතේන සච්ච වජ්ජේන හෝතු මෙ ජය මංගලං**